# ආබාධ සහිත පුද්ගලයන් රැකබලාගන්නන් දැන ගත යුතු කරුණු

- ප්‍රධාන ආබාධ තත්වය සහ මෙවැනි තත්වයන් ඇතිවීමට බලපෑ ප්‍රධාන හේතුව, ඇතිවිය හැකි අතුරු ආබාධ, පුනරුත්ථාපන ප්‍රතිකාර, පුහුණු කිරීමේ සැලැස්ම හා ඉලක්ක, නිවැරදි තොරතුරු ලබා ගැනීමේ මාර්ග, යන කරුණු පිළිබඳව හොඳ අවබෝධයක් තිබිය යුතුය.

- ආබාධිත තත්වය පිළිබඳව ඇති මිථ්‍යා මත දුරු කර ගත යුතුය. (උදා - ආබාධ ඇතිවන්නේ දඬුවමක් ලෙස, ආබාධ තත්ව බෝවිය හැකි බව, ඔවුන්ගේ සිතුම් පැතුම් අනිකුත් මිනිසුන් වගේ නොවේ යැයි සීතීම, ඔවුන් ආබාධිත නොමැති පුද්ගලයන්ට වඩා පහත් කොට සැලකිය යුතු බව, ඔවුන් සාමාන්‍ය පුරවැසියන් නොවේ යැයි සිතීම.)

- ආබාධ සහිත පුද්ගලයා, අන් අය මෙන් සුපුරුදු තත්වයට පත්නොවන විට, අධෛර්යමත් නොවී පුනරුත්ථාපන ක්‍රියාවලිය අත් නොහැරිය යුතුය. පුනරුත්ථාපන ප්‍රතිකාර වරින් වර ජීවිත කාලය තුළ දීම අවශ්‍ය විය හැක.

- සාර්ථක පුනරුත්ථාපන ක්‍රියාවලියක් සඳහා, පවුලේ සාමාජිකයන්ගේ කැපවීම, ප්‍රජාවේ සහාය, චිකිත්සක උපදෙස්, දීර්ඝ කාලීන රෝග වලින් පෙලෙන්නන් අවශ්‍ය පරිදි සායන වලට සහභාගී වීම වැනි කරුණු අත්‍යාවශ්‍ය බව.

- ආබාධ සහිත පුද්ගලයා ඇතුළු පවුලේ සාමාජිකයන්ට පුනරුත්ථාපන ක්‍රියාවලිය සම්බන්ධව ඉගෙන ගැනීමට බොහෝ කරුණු ඇත. පවුලේ සාමාජිකයන් කීප දෙනෙක් සිටී නම් එක් එක් සාමාජිකයා කුමක් සඳහා වගකීමක් (කාර්යභාරයක්) දැරිය යුතුද යන්න, සියලු දෙනා එක්ව සාකච්ඡා කරන්න. (උදා - එදිනෙදා වැඩ පුහුණු කිරීම, රෝහලට රැගෙන යෑම, ස්වයං රැකියාවක් පුහුණු කිරීමේදී වැනි) ප්‍රධාන රැකබලාගන්නා මේ සියලු තොරතුරු පිළිබඳව අවබෝධයක් තිබිය යුතුය.

- ආබාධ සහිත පුද්ගලයාට සාමාන්‍ය ආකාරයට අන් අය මෙන් ඇතැම් දේවල් කිරීමට නොහැකි විය හැකිය. එවැනි අවස්ථා වලදී එයට හේතුව හඳුනාගෙන එම ක්‍රියාකාරකම් කිරීමට වෙනත් ක්‍රම ඇත්දැයි සොයා බලන්න. මේ සඳහා වෙනස් කළ හැකි බොහෝ දේවල් ඇත. (උදා- ස්ථානය, කරන ආකාරය, භාවිත කරන උපකරණ, අමතර පුහුණුව වැනි කරුණු වැදගත් වේ.)

- ආබාධිත තත්වයේ ප්‍රබලතාව තීරණය වන්නේ ඔහුගේ බාහිර ස්වරූපය හෝ භාවිතා කරන උපකරණ අනුව නොව ඔහුගේ කාර්යයමය හැකියාව මතය.



- පවුලේ සාමාජිකයකු බෝවන රෝග වලින් පෙලෙන විට ඔහු විශේෂයෙන්ම ආබාධ සහිත පුද්ගලයාගෙන් වෙන් කොට තිබිය යුතුය.

- ආබාධ සහිත පුද්ගලයාගේ ආත්ම අභිමානයට හානිවන කිසිවක් පවුලේ අය විසින් නොකළ යුතුය. (උදා - අන් අය ඉදිරිපිට ඔහුගේ / ඇයගේ අඩුපාඩු විවේචනය කිරීම වැනි)

- ආබාධ සහිත පුද්ගලයා ප්‍රමාණය ඉක්මවා ප්‍රවේශම් නොකළ යුතුය. ආබාධයට පෙර කළ කාර්යභාරය හැකිතරම් දුරට කරගෙන යෑමට අවස්ථා ලබාදිය යුතුය. ප්‍රජාවේද ක්‍රියාකාරී සාමාජිකයකු වන්නේ නම් ඔහුගේ ජීවිතයේ ගුණාත්මක බව වැඩිදියුණු වේ.

- පවුලේ අය කරන වැඩ කටයුතු වලට ආබාධ සහිත පුද්ගලයා හැකි පමණින් සහභාගී කරගන්න. යහළුවන්, අසල්වැසියන් සමඟ සම්බන්ධවීමට අවස්ථා උදා කර දෙන්න. අදහස් හුවමාරු කර ගැනීමේ ගැටළු ඇත්නම් ඒ පිළිබඳව ඔවුන්ව දැනුවත් කරන්න.

- අනිවාර්යයෙන්ම දැනගත යුතු දුරකථන අංක පිළිබඳව පවුලේ සියලු දෙනාම දැනුවත්ව සිටින්න. ආබාධ සහිත පුද්ගලයාටද සියලු තොරතුරු දැන ගැනීමේ මාර්ග ඇති කර දෙන්න.



FAIR MED Health for the Poorest

මෙය ශ්‍රී ලංකා ෆෙයාමේඩ් පදනමේ පණිවිඩයකි.